# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1767/7 – 2012 ජූලි 16 වැනි සඳුදා – 2012.07.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2012 අංක 168 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/2/2011/එන්ආර්ඩී/342.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DIK/LAN/02/30/28.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 ජූලි මස 10 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, දික්වැල්ල.

2. **ඉඩමේ විස්තරය.**– දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව නැගෙනහිර සුළු කොට්ඨාසයේ, බඹරුන්ද මධ්‍යම ගමේ පිහිටි මාතර දිස්ත්‍රික් සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/DKW/2012/43 හා 2012.05.19 දිනැති අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0368 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඇහැටුගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0368 ක් පමණ**

උතුරට: එස්. ඒ. අමරලතා හිමිකම් කියන ඇහැටුගහවත්ත සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ දුම්රිය මාර්ගය සඳහා අත්කර ගෙන ඇති ඉඩම; දකුණට: දුම්රිය මාර්ගය සඳහා අත්කර ගෙන ඇති ඉඩම; බටහිරට: ඩී. රත්නසේකර හිමිකම් කියන එපිටවත්ත සහ එස්. ඒ. අමරලතා හිමිකම් කියන ඇහැටුගහවත්ත.

08 – 25

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2006 දෙසැම්බර් මස 06 වැනි දින අංක 1474/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 2006 අංක 353 දරන (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවෙන් සහ අංක CO/ MO/MRT/2003/791 දරන ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අංක (86) යන ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද)

39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, පහත උපලේඛනයෙහි සඳහන් ඒ (86) වැනි ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2003/එන්එච්/589.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 1/7/1/143.
2012 ජූලි මස 04 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සල්පිටි කෝරළේ සුළු කොට්ඨාසයේ, රාවතාවත්ත සහ ලක්ෂපතිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/ඩීඑස්ඕ/2010/94 හා 2010.04.29 දිනැති පැහැදිලි කිරීමේ අනුරේඛනයේ පෙන්නුම් කර ඇති පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් සහ මායිම්වලින් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අක්ෂර ඒ(86) – ලක්ෂපතිය පාර ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.0083 ක් පමණ**

උතුරට: වරි. අංක 57/3, ලක්ෂපතිය පාර, ලක්ෂපතිය පාර සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී සහ පී.පී.කො. 9051 හි කැබලි අංක 207; දකුණට: කැබලි අංක 207 සහ පී.පී.කො. 9051 හි කැබලි අංක 210; බටහිරට: වරි. අංකය නොදන්නා ඉඩම, ලක්ෂපතිය පාර සහ වරි. අංක 57/3, ලක්ෂපතිය පාර.

08 – 26

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 2012 අංක 169 දරන ආඥාව

මගේ යොමු අංකය: 4/3/15/2011/වීඊ/190.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/3/6/2/18.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2012 ජූලි මස 12 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.–** ප්‍රාදේශීය ලේකම්, උකුවෙල.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතලේ මැදසිය පත්තුව සුළු කොට්ඨාසයේ, උකුවෙල ගමේ පිහිටි මාතලේ දිස්ත්‍රික් සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ma/UKW/2011/319 හා 2012.01.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 18.6851 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස්:

**කැබලි අක්ෂර 'ඒ' – උකුවෙලවත්ත ඉඩම – ප්‍රමාණය: හෙක්. 8.9832 ක් පමණ**

උතුරට: මාර්ගය (ප්‍රා.ස.), මාර්ගය, ඩබ්. ජී. ටිකිරිබණ්ඩා හිමිකම් කියන වෙලගෙදරවත්ත සහ අඩිපාර; නැගෙනහිරට: කේ. ආර්. බී. ගුණතිලක හිමිකම් කියන තුන්පැලේ කුඹුර, පොඩිමැනිකේ රත්නායක සහ තවත් අය හිමිකම් කියන උකුවෙලවත්ත, මාර්ගය සහ එම්. කේ. රාජකුරු සහ තවත් අය හිමිකම් කියන තෝරදියපොලගෙදරවත්ත; දකුණට: අඩිපාර, එන්. ජී. සරත්කුමාර සහ තවත් අය හිමිකම් කියන උකුවෙලවත්ත සහ මාර්ගය (ප්‍රා.ස.); බටහිරට: මාර්ගය (ප්‍රා.ස.).

**කැබලි අක්ෂර 'බී' – උකුවෙලවත්ත ඉඩම – ප්‍රමාණය: හෙක්. 9.7019 ක් පමණ**

උතුරට: ඩබ්. ඒ. විමලසේන සහ තවත් අය හිමිකම් කියන උකුවෙලවත්ත සහ මාර්ගය (ප්‍රා.ස.); නැගෙනහිරට: මාර්ගය (ප්‍රා.ස.), ඩී. ඒ. අප්පුහාමි සහ තවත් අය හිමිකම් කියන උකුවෙලවත්ත, උකුවෙලවත්ත පාරිසරික ගොවිපල හා කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථානය හිමිකම් කියන උකුවෙලවත්ත සහ උකුවෙල සංස්කෘතික මධ්‍යස්ථානය හිමිකම් කියන උකුවෙලවත්ත; දකුණට: මාර්ගය (ප්‍රා.ස.) සහ නන්දාවතී හිමිකම් කියන උකුවෙලවත්ත; බටහිරට: මාර්ගය (ප්‍රා.ස.), හිගිරා ජනපදය හිමිකම් කියන උකුවෙලවත්ත සහ ඩබ්. ඒ. විමලසේන සහ තවත් අය හිමිකම් කියන උකුවෙලවත්ත.

08 – 27

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.